## පළමුවන දේව ප්‍රකාශනය

ගණන් කථාව 11:25-29

ගණන් කථාවෙන් උපුටා ගත් කොටසකි.

**"දෙවිඳාණෝ මුළු සෙනග දිවැසිවරුන් කර සිය ආත්මානුභාවය දෙන සේක් නම් කෙතරම් අනගි ද?"**

සමිඳාණන් වහන්සේ වළාකුළකින් බැස අවුත්, මෝසෙස්ට කතා කොට, ඔහු මත වූ ආත්මානුභාවයෙන් කොටසක් ගෙන මූලිකයන් හැත්තෑදෙනාට දුන් සේක. ආත්මානුභාවය ඔවුන් මත පහළ වූ විට, ඔව්හු මඳ වේලාවක් දිවැස්වැකි කීමට පටන් ගත්හ. එහෙත් මොවුන් ගෙන් දෙදෙනෙක් කඳවුරෙහි නැවතී සිටියහ. එක්කෙනෙකුගේ නම එල්දද් ය. අනික් තැනැත්තා මේදද් ය. මොව්හු සෙස්සන් අතර ලේඛනගත වී තිබුණ නමුත් කූඩාරමට නොගියහ. එහෙත් ආත්මානුභාවය ඔවුන් මත ද පහළ වූයෙන් කඳවුර තුළ ඔව්හු දිවැස්වැකි කීහ. එවිට එක් තරුණයෙක් දිව ගොස් එල්දද් සහ මේදද් කඳවුර තුළ දිවැස්වැකි කියන බව මෝසෙස්ට සැළ කළේය. එවිට තරුණ වියේ පටන් මෝසෙස්ට සේවය කළ නූන්ගේ පුත් ජෝෂුවා කතා කොට, "මා පිය මෝසෙස් තුමනි, ඔවුන් නවතාලන්නැ"යි ඉල්ලී ය. මෝසෙස් ඔහුට කතා කොට, "ඔබ මාගේ යහපතට ඊර්ෂ්‍යා කරන්නෙහි ද? දෙවිඳාණෝ උන් වහන්සේගේ මුළු සෙනග දිවැසිවරුන් කර ඔවුන් හට සිය ආත්මානුභාවය දෙන සේක් නම් කෙතරම් අනගි ද"යි පිළිතුරු දුනි.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 19:7, 9, 11-13

පිළිතුර: සමිඳු අණපණත් සිතට සතුට වඩන්නේ ය.

ගීය: සමිඳුන්ගේ ව්‍යවස්ථාව පරිසමාප්ත ය; ජීවිතය පණ ගන්වන්නේ ය. සමිඳුන්ගේ නීතිය සත්‍යවාදී ය; අනුවණයන්ට නුවණ දෙන්නේ ය. සමිඳුන් කෙරෙහි ගරුබිය නිර්මල ය; එය සදහට ම පවතින්නේ ය.

සමිඳුන්ගේ විනිශ්චය යුක්තිසහගත ය; මුළුමනින් දැහැමි වේ ම ය. එය ඔබ සේවකයා හට අනතුරු ඇඟවීමක් වන්නේ ය; එය පිළිපැදීමෙන් විපුල විපාක අත්වන්නේ ය.

මාගේ රහස් වැරදි දන්නෝ කවුරු ද? නොදැන මා කළ පව් සෝදා හළ මැනව. උඩඟුකමේ පාපයෙන් මා වැළැක්වුව මැනව. එහි බලපෑමට මම යටත් නොවෙම්වා. එවිට මම දරුණු පවින් නිදහස් වී, නිදොස් කෙනෙක් වන්නෙමි.

## දෙවන දේව ප්‍රකාශනය

ජාකොබ් 5:1-6

ජාකොබ් තුමන් විසින් ලියන ලද හසුනෙන් කොටසකි.

**(ඔබගේ ධන ධාන්‍ය දිරාගොස් ඇත.)**

දැන් ඉතින් ධනවතුනි, ඔබ පිට පැමිණෙන්නට තිබෙන අවාසනාවන්ත ඉරණම ගැන හඬා වැලපෙන්න. ඔබගේ ධන ධාන්‍ය දිරාගොස් ඇත, ඔබගේ වස්ත්‍ර කාවුන් කා දමා ඇත. ඔබේ රන් රිදී මලකඩ කා ඇත; ඒ මලකඩ ඔබට විරුද්ධ ව සාක්ෂියක් වී, ගින්නක් මෙන් ඔබගේ මාංස කා දමනු ඇත. ඔබ වස්තු ගොඩගසා ඇත්තේ නිම වේගෙන යන යුගයක ය. බලන්න, ඔබගේ කෙත් වතුවල අස්වැන්න නෙළූ ගොවීන්ට නොගෙවා ඔබ වංචා කරගත් ඔවුන්ගේ කුලිය ඔබට විරුද්ධ ව මොරගසයි.

ගොවීන්ගේ මොරගැසීම සේනාවල සමිඳුණන් වහන්සේගේ කන්වල වැටෙන්නේ ය. ඔබ මෙලොව කම් සැප විහරණයෙහි ඇලී ගැලී, මරන්නට තර කරන සතුන් මෙන් පුෂ්ටිමත් වෙමින් කල් යැවූවහු ය. ඒ දිනය දන් පැමිණ ඇත. විරෝධයක් නොපෑ නිදෙස් මිනිසාට වුව ද ඔබ වරද එල්ල කොට ඔහු මරා දැමූවහු ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

ජොහන් 17:17

ආලේලූයා! ආලේලූයා!
"සත්‍යය නම් ඔබගේ ධර්මය යː සත්‍යයෙහි ඔවුන් කැප කළ මැනව."යි සමිඳාණන් වහන්සේ වදාරණ සේක.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

මාක් 9:38-43, 45, 47-48

මාක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**("ඔබේ වැටීමට හේතුව ඔබේ පාදය නම් එය කපා දමන්න.")**

ජොහන් ජේසුස් වහන්සේට කතා කොට, "ගුරුදේවයෙනි, අප අනුගමනය නොකරන කෙනෙකු ඔබේ නාමයෙන් දුෂ්ටාත්මයන් දුරු කරනු දුටිමු; ඔහු අප අනුගමනය නොකරන නිසා අපි ඔහුට එය තහනම් කෙළෙමු"යි කීවේ ය. එහෙත් ජේසුස් වහන්සේ "තහනම් නොකරන්න. මාගේ නාමයෙන් ප්‍රබල ක්‍රියාවක් කරන කවරෙකුටවත් ඒ හුස්මෙන් ම මා ගැන අපවාදයක් කරන්න නොහැකි ය. අපට විපක්ෂ නොවන්නා අපේ පක්ෂයෙහි ය. ඔබ ක්‍රිස්තුන් වහන්සේට අයිති බැවින් ඒ නාමයෙන් යමෙක් ඔබට වතුර කෝප්පයක් වුව ද බොන්න දෙන්නේ නම්, එහි ආනිශංසය ඔහුගෙන් කිසි සේත් නැති නොවන්නේ යයි සැබැවින් ම මම ඔබට කියමි"යි වදාළ සේක. තවද, උන් වහන්සේ කතා කරමින් "මා කෙරෙහි අදහාගත් මේ බාලයන්ගෙන් එකෙකු වත් නොමග යවන යම් කෙනෙක් ඇද්ද, ඔහුගේ ගෙල වටා මහා ඇඹරුම් ගලක් එල්ලා මුහුදේ හෙළාදැමීම ඔහුට යහපත. ඔබේ වැටීමට හේතුව ඔබේ අත නම් එය කපා දමන්න. දෑත ඇතිව අපායෙහි නොනිවෙන ගින්නට යාමට වඩා අබ්බාගාත ව ජීවනයට ඇතුළුවීම ඔබට යහපත. ඔබේ වැටීමට හේතුව ඔබේ පාදය නම් එය කපා දමන්න. දෙපා ඇතිව අපායට හෙළනු ලැබීමට වඩා කොර ව ජීවනයට ඇතුළුවීම ඔබට යහපත. ඔබේ වැටීමට හේතුව ඔබේ ඇස නම් එය උපුටා දමන්න. දෑස ඇතිව අපායේ හෙළනු ලැබීමට වඩා එක ඇසක් ඇතිව දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුළුවීම ඔබට යහපත. අපායේ දී ඔවුන් කාදමන පණුවා නොනසියි, ඔවුන් දවාලන ගින්න ද නොනිවෙයි."

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.